# දර්ශනයක් වශයෙන් බුදු දහමේ ඇති වැදගත්කම

ගරු ත්‍රිපිකවේදී නාරාවිල අරියවිමල ස්ථවිරයන් වහන්සේ විසිනි.

ලෝකයේ විවිධ දර්ශනයන් පහළ වූ රටවල් අතුරෙන් පෙරදිගින් ඉන්දියාවත් අපරදිගින් ග්‍රීසියත් ප්‍රමුඛස්ථානයක් ගනී. මේ දෙර ටෙහි කලින් කල ජනිත වූ ආගමික නායක යෝ බොහෝ දෙනෙකි. එයින් පූරණ කස්සප. අජිතකෙසකම්බල, මක්ඛලි ගොසාල, සඤ්ජයබෙල්ලට්ඨිපුත්ත, නිගණ්ඨ නාථපුත්ත, පකුධ කච්චායන, ආළාර කාලාම, උද්දකාරාම පුත්ත යනාදීන් ක්‍රි: පූ: 6 වෙනි සියවසේ ප්‍රාග් බුද්ධසමයේ ප්‍රධාන තැනක් ගත් බව බ්‍රහ්මජාල, සාමඤ්ඤඵල[1] ආදී සූත්‍රවලින් පෙනේ.

සෙනෝපනීස්, හෙරක්ලෙයිටෝස්, තාලේස්පාමිනයිඩීස්, සීනෝ, ඇනැක්ෂිමැන්ඩර්, ඇනැක්සිමීනීස්, ඩිමොක්‍රිටෝස්, පෛතගෝරස්, එම්පිඩෙක්ලීස්, ඇනැක්සිගෝරස්, සොක්‍රටීස් යනාදීහු අපරදිග දර්ශනිකයන් ලෙස ගැනෙත්.

මේ හැම දෙනෙකුගේම පර්මාර්ථය වී ඇත්තේ සත්‍යය සෙවීම විය හැකි යි. තමතමන්ගේ දර්ශනවල ඇති පටුකම නිසා ඇත්ත ඇති සැටියට තෝරා ගැනීමට නො හැකිවී ඇති බව ඒ දර්ශනයන් පරීක්ෂා කැරැ බැලීමේ දී පෙනේ.

රවි, ඉන්ද්‍ර, අග්නි යන තිදෙනා පිදීම (යාග හෝම කිරීම) ආවශ්‍යක බව වෙදයෙන් හෙළිවෙයි. මීමාංසා දර්ශනයේ දී එය තහවුරු කිරීමට කරුණු දක්වා ඇති බව පෙනේ. ශරතුස්ත්‍ර දර්ශනයේ ඉගැන්වෙන්නේ මීට සමානවූම ඉගැන්වීමෙකි. අහුරමස්ද නම් මැවුම්කරුවා පිදීම හා සුමනස්, සුවක්, සුකෘති යන ක්‍රමය වැඩීම නියම සත්‍යය බව එහි දක්වා ඇත ප්‍රකෘති, පුරුෂා දී පස්විස්සක් දක්වා ඒ පදර්ථයන් දැනීම මොක්ෂ ලාභයට හේතුවන බව සාංඛ්‍ය දර්ශනයේ ඉගැන්වේ. එම පස්විස්සට ඊශ්වර පදර්ථයක් එක්කොට ඒ සවිසි පදර්ථයන් දැනීම නිසා මොක්ෂඥානය ලබන බව පාතඤ්ජල දර්ශනයෙහි දක්වා ඇත. ප්‍රමාණ - ප්‍රමෙයාදි සොළොස් පදර්ථයක් දක්වා එහි ආත්ම ශරීර, ඉන්ද්‍රිය ආදිය ප්‍රත්‍යක්ෂ, අනුමාන උපමාන ශබ්ද යන ප්‍රමාණ සතරින් දැනීමෙන්ම මෝක්ෂ ලාභය වන බව න්‍යාය දර්ශනයේ සඳහන්ව ඇත. ද්‍රව්‍ය, ගුණ, කර්ම සාමාන්‍යාදීන් ගේ තත්ත්ව ඥානය නිසා මෝක්ෂ ඥනය ලැබීම වෛශෙෂික දර්ශනයේ ඉගැන්වේ.

ජීව අජීවාදි වශයෙන් ද්‍රව්‍යයන්ගේ සත්තාව අවබෝධ කර ගැන්ම සත්‍යමය දර්ශනය බව ජෛනාගමයේ දැක්වේ. එසේම බ්‍රහ්මයා හා මායාරූප වූ ලෝකය තතුසේ දැන ගැන්ම නියම දර්ශනය යැයි වේදන්තයේ ඉගැන්වේ. විශ්වාසය, ප්‍රාර්ථනාව, පිළිපැදීම, මෝක්ෂ මාර්ගය, හැටියට කිතු දහමේ ඉගැන්වේ. ජීවත්වන තාක් හැම සැපක්ම විඳිය යුතු බව චාර්වාක දර්ශනයේ දැක්වේ. ඉහතින් සඳහන් කළ දර්ශනවල නියම තත්ත්වය දැන ගැනීමට හැකිවූයේ බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කිරීමට පටන්ගත් දින සිට ය. බුදුදහම ද කර්මය, පුනරුත්පත්තිය හා මුක්තිය ආදී කරුණු මූලික ව උගන්වයි. එහෙත් බ්‍රහ්මවාදයට, ආත්මවාදයට, කුල වාදයට තදින් ම පහර ගසා ඇත. විශිෂ්ට විමුක්තිය හෙවත් නිර්වාණය ගැන උගන්

වනුයේ බුදුදහමේ පමණි. බුදුරදුන් හැම කරුණක් ම ඉදිරිපත් කර ඇත්තේ අන් සියල්ලට ම වඩා ප්‍රඥාගෝචරව හා විචාරාත්මක ව ය. එසේම උන්වහන්සේ පහළ වූයේ ලොව යටපත්ව තිබූ සත්‍යධර්මය මතුකරදීම සඳහා ය. කල්ප ගණනක් පෙරුම් පුරා ආ කෙනෙකුන් බව බුද්ධ චරිතයෙන් පෙනේ. එහෙයින් උන්වහන්සේගේ ධර්මය වෙනත් ධර්මයකට සම කළ නොහැකි ය.

බුදුරජාණන් වහන්සේ සිය ධර්මය දේශනා කරද්දී එදා තදින් මුල් බැස ගෙන තිබුණු බ්‍රාහ්මණ ධර්මයේ දුබල අංශයන්ට පහර දී ඒවා බිඳ හෙළු සේක. කුලවාදය හා යාගය බ්‍රාහ්මණ ධර්මයේ දුබලම අංශයෙකි. බ්‍රාහ්මණ ඉගැන්වීම් වලට වඩා ඉතාම නිවැරදි පැත්තක් සුත්ත නිපාතයේ බ්‍රාහ්මණ ධම්මික සූත්‍රයෙන් හා සංයුත්ත නිකායේ යඤ්ඤ සූත්‍රයෙන් උගන්වා ඇත. ඒ සූත්‍ර දෙකෙන්ම යාගයේ නිසරු බව හා ආධ්‍යාත්මික දියුණුවේ සරු බව දක්වේ. එසේ අම්බට්ඨ, වාසෙට්ඨ, අස්සලා යන ආදී සූත්‍රවල දී කුලවාදයට පහර දී ඇත.

මෙසේ නිසරු අනෛර්‍යාණික ඉගැන්වීම් වලට නිර්දය ලෙස පහර දුන් බුදුරජාණන් වහන්සේ ලෞකික ලෝකෝත්තර වශයෙන් අළුත් වූ ද ප්‍රඥාගොචර වූ ද විශිෂ්ට විචාර ක්‍රමයක් දක්වා ඇත. බුද්ධ ධර්මය දර්ශනයක් වශයෙන් වුව ද අද්විතීය ශ්‍රේෂ්ඨත්වයක් උසුලයි. බුද්ධධර්මය සර්ව අශුභවාදීව ද, සර්ව ශුභවාදීව ද සමහරුන් සිතතත් ඒ අන්ත දෙකින් ම විනිර්මුක්තවූ ධර්මයක් බව කරුණු විමසීමෙන් පෙනේ. "මෙපමණ කලක් මම හාරා අවුස්සා ඇති දර්ශන වලින් බුද්ධ ධර්මය තරම් ශ්‍රේෂ්ඨ දර්ශනයක් මට තවම හමුවී නැත" යනුවෙන් මහාචාර්ය කේ. ඇන්. ජයතිලක මහතා ප්‍රකාශ කර ඇත්තේ මේ නිසා විය යුතුය. "අත්තාහි අත්තනො නාථො-කොහි නාථො පරො සියා"[2] තමාට පිහිට තමා ම ය. වෙන කවරෙක් තමාට පිහිට වේ ද? මෙවැනි දේශනා නිසා නිර්මාපක දෙවියකුට හෝ උපනිෂද්වල දැක්වෙන ඊශ්වරයකුට හෝ බ්‍රහ්මයකුට හෝ කිසිදු තැනක් නො දෙන බුද්ධ ධර්මය ආගමක් වශයෙන් හැඳින්වීම උචිත නො වේ. බුද්ධ ධර්මයෙහි සෙසු ආගම් වල දක්වන යාචඤාවිධි හෝ පූජාවිධි දක්නට නැත. Religion (Religio) යන ඉංග්‍රීසි වචනයෙන් ඉදිරිපත් කළ හැකි අදහස් අතර.[3]

(1) ජගත් නිර්මාණ කර්තෘ වූ ගෞරවයට හා නමස්කාරයට අරමුණු වූ දෙවියකු, ඊශ්වරයකු ඇතැයි විශ්වාස කිරීම.

(2) මිනිසා විසින් දෙවියන් සඳහා කටයුතු වූ සියලු අනුෂ්ඨාන පුද - පූජා යාචඤා විධි හා දිව්‍ය භාවය සතුට කිරීම සඳහා දැක්වෙන ආඛ්‍යාන ධර්ම.

(3) මිනිසා සම්බන්ධයෙන් දෙවියන් ගේ වගකීම හා දේවනීතිය.

(4) දෙවියන්ගේ ආශීර්වාදය හා දඬුවම.

(5) දේවධර්ම හා ශුද්ධත්වය.

(6) තපස හා සදාචාරය.

(7) දෙවියන් කෙරෙහි මිනිසාගේ සුවච භාවය.

(8) අදෘශ්‍යමාන අලෞකික දේවත්වය පිළිබඳ ගෞරවය.

(9) දෙවියන් කෙරෙහි භීතිය හා දුඃඛිතවීම.

යනාදි අර්ථ ප්‍රකාශ කෙරෙයි. මේ නිසා "Religion" යන්නෙහිත් බුද්ධාගමයෙහිත් කිසිදු සම්බන්ධයක් නැත. මේ අදහස් අනුව හින්දු ආගමේ ද මුඛ්‍යපරමාර්ථය බ්‍රහ්මයාට එකතුවීම යි. ක්‍රිස්තියානි ආගමේ ද මුඛ්‍යපරමාර්ථය ආත්මයට ආත්මය එකතුවීම හෙවත්, දෙවියන්ට එකතුවීම යි. මෙවැනි අදහසක් බෞද්ධයන් ගේ "ආගම" යන්නෙන් අදහස් කරනු නො ලැබේ. බුධාගමයේ ආගම යන්නෙන් අදහස් කරනු

ලබන්නේ ආ + ගම් ධාතුවෙන් සිද්ධ අවබෝධය යන අර්ථ ය යි. බුද්ධධර්මයේ ආගම යන්නට යොදන පාරිභාෂික වචන නම් "ධම්මවිනය, බ්‍රහ්මචරිය, සුගතවිනය, අරියවිනය, බුද්ධසාසන පාවචන යන මේවා ය. මේ නිසා බුද්ධාගම යනුවෙන් අදහස් කෙරෙන්නේ නියම දිවි පැවැත්මෙහි මාර්ගය යි. නිර්මාණවාදී ආගම් ගොඩ නඟා ඇත්තේ කිසියම් ශ්‍රැති පරම්පරාවක් පදනම් කරගෙන යි. එබැවින් ඒවා සත්‍ය හෝ අසත්‍ය හෝ විය හැකි යි. බුද්ධාගමය එසේ ශ්‍රැති පරම්පරාවන් මත ගොඩ නැඟුණක් නො වේ. බුද්ධ දේශනා වෙනත් අයට නොදී උන්වහන්සේට පමණක් සීමා වූ ඒවාද නොවෙත්. එබැවින් බුද්ධාගමයේ ශක්තිය උන්වහන්සේ විසින් ද දහස් ගණන් ශ්‍රාවකයන් විසින් ද සමර්ථනය කරන ලද බව සැලැකිය යුතු ය.

බුද්ධාගම දර්ශනවාදයක් ලෙස පිළිගත නො හැකි ය. සියලුම දර්ශනවාද ගොඩ නැගී ඇත්තේ තර්කය මත යි. දර්ශන-වාදවල ඌනතා දක්නට ලැබේ. ජීවිතයේ විවිධ ගැටලු දර්ශනවාද වලින් සොයාගෙන තිබුණ ද, ඒවායින් මිදීමේ මඟක් දක්වා නැත. එබැවින් අසීමිත ලෙස සිතා සිතීමේ කෙළවරට පත්ව සිත් තැවුලක් ඇතිවීම දර්ශනවාදවල දක්නට ලැබේ. බුද්ධධර්මය මේ ලක්ෂණ වලින් තොරයි. එබැවින් අතක්කාවචර යි.

බුද්ධාගමයෙහි වූ කලී දෘෂ්ටිගෝචර න්‍යායයක් දක්නට ලැබේ යයි කේ. ඇන්. ජයතිලක මහතා ප්‍රකාශ කරයි. බෞද්ධ සාහිත්‍යයේ දර්ශන යන්න හුවා දක්වෙන්නේ දිට්ඨි යන වචනයෙනි. ඒ අනුව බෞද්ධ දර්ශනය සම්‍යග් දෘෂ්ටියක් වශයෙන් දක්වා ඇත. බෞද්ධ දර්ශනයේ පරමාර්ථය ඤාණ දස්සනය ලබා ගැනීමයි. හෙවත් සත්‍ය ඥානය ලබා ගැනීම යි. ''දස්සනෙන සම්පන්නො'' ''යථාභූතං ඤාණ දස්සනං'' යනුවෙන් සත්‍ය ඥානය ලැබීමේ පැහැදිලි ප්‍රකාශයක් වෙනත් දර්ශනවල නො වේ. වෙනත් වචනවලින් සඳහන් කළොත් දර්ශන වල පැහැදිලි ඥානමාර්ගයෙක් නැත. එබැවින් බුද්ධාගම දර්ශනයෙක් නොවේ.

බටහිර දර්ශනයෙහි දර්ශන යන්නට අර්ථ දක්වා ඇත්තේ (Philosophy) යන වචනයෙනි. ඤාණයට ලැදිකම යන අර්ථය මෙහි පවතී. සෑම දර්ශනයක් ම පහළ වූයේ ආගමික චින්තාවන් මත ය. එබැවින් දියුණු වූ සෑම ආගමක ම දර්ශනයක් පවතී. එබැවින් ආගමයත් දර්ශනයත් එකෙකැයි පිළිගැනීම සුදුසු නොවේ.

දර්ශනය යනු මොක්ෂය සෙවීම යන විග්‍රහය පිළිගනිතොත් හෙවත් වඩා නිවැරදි නම් බුද්ධධර්මය ද සත්‍ය වූ ද, සාර්ථක වූ ද, දර්ශනයෙකි. බුද්ධාගමයේ උගන්වන මොක්ෂය හෙවත් නිර්වාණය සඳහට ම පවත්නා ලොවුතුරා බුදුවරයකු විසින් ම ලෝකයාට පෙන්වා දිය හැකි සත්‍ය ධර්මයක් බව පෙනේ. සසර සාකල්‍යයෙන් ම දුක නම් ඒ දුකින් මිදීම මැ බුදුදහමේ උගන්වන මෝක්ෂය හෙවත් නිර්වාණය යි. මේ සත්‍යය පෙන්වා දුන්නේ ද, ඒ සඳහා මාර්ගය පැහැදිලි කෙළේ ද, බුද්ධධර්මයෙන් පමණි. එහෙයින් දර්ශනයකින් බලාපොරොත්තු වන උසස් ම ප්‍රතිඵලය බෞද්ධ දර්ශනයෙන් ලබා ගත හැකි ය.

'දස්සනෙන සම්පන්නො' යන බුදු වදනින් මෙයට දස්සන (දර්ශන) යන ව්‍යවහාරය ශාස්තෘන් වහන්සේ ද ඉවසූ බව ඔප්පු කළ හැකි ය. ආගම යන වචනය අපරදිග විචාරකයන් කෙසේ විග්‍රහ කළත් එහි ඇතුළත් අවබෝධාර්ථය ගැන සලකන විට බුදුදහම ශ්‍රේෂ්ඨ ආගමයෙකි. චතුරාර්‍ය සත්‍යාවබෝධය ගැන සැලකීම ම එයට ප්‍රමාණවත් ය. ''ආගතාගමා ධම්මධරා විනයධරා'' යනාදි දේශනාපාඨයෙන් ද බුදුදහම ආගමක් වශයෙන් සැලකීම යෝග්‍ය බව පිළිගැනේ.

මේ හැමට ම වඩා බුදුදහමේ දර්ශනික සාරවත් බවක් ශ්‍රේෂ්ඨත්වයක් රැඳී ඇත්තේ ඉන්දීය ඇතැම් දර්ශනයන්ට අසු නො වූ ඇතැම් දර්ශනයන් විසින් අවුල් කොට ඉගැන් වූ 'කර්මය, පුනරුත්පත්තිය, සංසාරය, සත්වයා, ලෝකතත්ත්වය, විමුක්තිය' වැන දර්ශනිකාඞ්ග අභිනව පදනමක් උඩ වඩා ප්‍රඥාගෝචර ලෙස තර්කානුකූල ව විචාරයට පැමිණවීම නිසා ය. මේ නිසා එද ඉන්දීය දර්ශනයන්ට අයත් වූ ශාස්වත හා උච්ඡේද දෘෂ්ටීන්ට නැඹුරු වූ සෙසු සකල දර්ශනයන් දඹරන් ඉදිරියේ බෙලෙක් පතුරු බවට පත් වූ බව පෙනේ. මේ නිසා උන්වහන්සේ ඉදිරිපත් කළ හේතුඵල වාදය හා අනාත්මවාදය භාරතීය දර්ශනයන්හි මල්ඵල ගැන්වූ බව පෙනේ.

බුදුදහම හේතුඵලවාදය නිසා තර්කානුකූල ව නිගමන දක්වන උසස් දර්ශනයක් වූ අතර අනාත්මවාදයෙන් සියලුම ඉන්දීය දර්ශනයන්ට වඩා විශිෂ්ටත්වයක් ලබන දර්ශනයක් බවට පත් වූ බව පෙනේ. ආත්මවාදය ඉතා බුද්ධි ගෝචර තර්ක මාගීයෙන් බිඳ හෙලූ හැටි මැදුම් සඟියේ අලගද්දූපම සූත්‍රයේ එයි.

බෞද්ධ දර්ශනයෙහි ආත්මවාදයක් නූගැන්වුවද අත්ත ශබ්දය ත්‍රිපිටකයේ නොයෙක් තන්හි යෙදී ඇත. දීඝනිකායේ පොට්ඨපාද සූත්‍රයේ දී පොට්ඨපාද ප්‍රකාශ කරන ආකාරයට ආත්මය යනු සතරමහාභූතයන්ගෙන් හටගත් ආහාර අනුභව කරන තැනැත්තෙකි. සියලු අඟපසඟ ඇති නොපිරිහුණු ඉන්ද්‍රියන් ඇති මනෝමය ධර්මයෙකි. මෙසේ හේ එහි නොයෙක් ලෙසින් ආත්මය තේරුම්කරයි. පංචස්කන්ධයාගේ නිත්‍ය වූ ස්වාමිත්වය පිළිබඳ සංකල්පය ආත්මය වශයෙන් සලකා ඇති බව පෙනේ. ''න එතං මම න එසො අහං අස්මි න එසො අත්තා''[4] යනුවෙන් අනත්තලක්ඛණ සූත්‍රයේ දී තමාත් තමාට නො වසඟ නම් ආත්මයක් කොයින් ද? රූප, වේදනාදීන්හි ආත්මය ගැන කියනුම් කිම? යනුවෙන් වදළහ. මෙසේ ආත්මවාදයත්, උච්ඡේදවාදයත්, ඛණ්ඩනය කොට තිබේ. ''බ්‍රහ්ම නැමැති ඊශ්වරයෙක් අජරාමර ව වෙසෙමින් සචරාචර විශ්වයෙහි ආඥා පතුරුවමින් සිටින්නේය'' යන උපනිෂද් මතය ''සබ්බං නා හොසිං සබ්බං මෙති නාහොසිං'' යනුවෙන් මජ්ඣිම නිකායේ ඉගැන්වීම් වලින් ඛණ්ඩනය කරයි.

දිනක් මොඝරාජ නම් බමුණා අමෘතය පතන්නෙකු ලොව බැලිය යුත්තේ කෙසේ දැයි ප්‍රශ්න කෙළේය. ඊට පිළිතුරු දෙන බුදුරදහු,

''සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු
මොඝරාජා සද සතො
අත්තානු දිට්ඨී මූහච්ච එවං මච්චු
කරො සියා
එවං ලොකං අවෙක්ඛන්තං මච්චු
රාජා න පස්සති''

යනුවෙන් ලෝකය ශූන්‍ය දෙයක් හැටියට බැලිය යුතු බවත්, ආත්මය ඇතැයි යන විපරීත සංඥාව දුරු කිරීමෙන්, අමෘතය ලද හැකි බවත් දෙසූහ. මේ නිසා ආත්මවාදයට බුදුදහමින් කිසිම ඉඩක් නැති බව මේ ඉහත සඳහන් කරුණු වලින් පෙනේ.

කර්මවාදයත්, පුනර්භවයත් බුදුරජාණන් වහන්සේ විසින් පිළිගෙන ඇත්තේ පෙර තිබූ මත හා වාද පිළිගනු ලැබීම නිසා යැ'යි ''බෙරිඩේල්කීත්'' මහතා ප්‍රකාශ කරයි. වර්තමාන බටහිර චින්තකයෙකු වූ බර්ට්‍රන් රසල්සාමි හේතු, ඵල වාදය මෙසේ විග්‍රහ කරයි. A ඇති කල B තිබේ නම් ''A'' නැති කල B නැතිනම් ''A'' ''B'' වල හේතුව යි. මෙයට ම සමාන අදහසක් මජ්ඣිම නිකායෙහි සඳහන් වේ. එනම්

''ඉමස්මිං සති ඉදං හොති, ඉමස්ස උප්පාද ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති'' යනුවෙනි.

පටිච්ච සමුප්පාදයේ ද්වාදශාංගය පූර්ව ජීවිතය හා වර්තමාන ජීවිතය සම්බන්ධ කරන විලාශයකින් අභිසමය සංයුක්තයේ දැක්වෙන අතර ප්‍රවර්තමානස්කන්ධයන්ගේ හේතු දර්ශනය වශයෙන් දීඝනිකායේ මහානිදාන සූත්‍රයේ දී දක් වේ. අභිධර්මයේදී සූවිසිප්‍රත්‍යය වශයෙන් දක්වෙන්නේ ද මේ හේතුඵල වාදය යි. හේතුඵලවාදය ආරම්භ කළ යුත්තේ මේ ස්ථානයෙන් ම යැයි කියා දක්වා නැත. සමහර දේශනාවල අගසිට මුලටත්, මුලසිට අගටත් මැදසිට අගටත් වශයෙන් දේශනාකොට ඇත.

කර්මවාදයද, බුදුදහමේ ඇති වැදගත් ඉගැන්වීමෙකි. යම් සත්වයකු ලොව උප දින්නේත්, ජීවත්වන්නේත් චුතවන්නේත් කර්මය අනුව ය. වෙනත් ආගම්වල එය උත්තරීතර පුද්ගලයකුගේ සහායත්වයකින් සිදුවන බව ඉගැන් වේ. බුදුදහමෙහි සත්වයෙකුගේ පෙරැ ආත්මස්වභාවය ද මතු ආත්ම ස්වභාවය ද මෙකල ආත්ම ස්වභාවය ද පිළිබඳ සැකය සත්‍යාවබෝධයට හානිකර බව

කර්මය කරන්නා හා විපාක විඳින්නා යන දෙදෙනාම එකෙ කැයි කිම එක් අන්තයෙකි. මේ දෙදෙනා දෙදෙනෙකැයි කීම තවත් අන්තයෙකි. මේ අන්තද්වය ම ප්‍රතික්ෂෙප කළ බුදුරදහු මැදුම් පිළිවෙතක් දෙසූහ. එහෙත් උන් වහන්සේ කර්මවාදය ප්‍රතික්ෂෙප නො කළ සේක. ජෛනාගමයේ දණ්ඩ නාම යෙන් කර්මවාදය ඉදිරිපත් කෙරෙන අතර ඒවා ක්ෂය කිරීමේ මාර්ග දෙකක් ද දක්වේ. එනම් ඔපක්කමික හා යථාකම්ම වශයෙනි. සෙසු කර්මයන් ගෙවී යැමට ඉඩ හැරීම යථාකම්ම නමි.

සෙසු දර්ශනයන්හි නො ඉගැන්වෙන ත්‍රිලක්ෂණය ප්‍රතීත්‍ය සමුත්පාදය, බෝධි පාක්ෂික ධර්ම, නිර්වාණය ආදී ගැඹුරුවූ ද, සත්‍යවූ ද කරුණු උසස් විචාරමාර්ගයකින් විවරණය කොට චතුස්සත්‍යය විසින් ඉගැන්වීමත් ඒ මගින් සත්වයාට සදකාලික සත්‍ය විමුක්තියක් සඳහා අවස්ථාව සලසා දීමත් බෞද්ධ දර්ශනයේ ශ්‍රෙෂ්ඨත්වයට ප්‍රමාණවත් ය.

බුදුන්වහන්සේ ද මහා පරිනිර්වාණසූත්‍ර දේශනයෙහි දී ''ඉමස්මිං බො සුභද්ද ධම්ම විනයෙත් අරියො අට්ඨඞ්ගිකො මග්ගො උපලබ්භති'' යනු ද සුඤ්ඤා පරප්පවාද සමණෙහි අඤ්ඤෙ යනු ද දක්වමින් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයත් ප්‍රථමාදි ශ්‍රමණයන් සතරනම මේ ශාසනයේම ඇතුළත් බවත් අන්‍ය දෘෂ්ටිවාද සංඛ්‍යාත පරප්‍රවාදයන් ශ්‍රමණයන් කෙරෙන් ශූන්‍ය බවත් දෙසූ සේක. මේ දර්ශනික ඉගැන්වීම නිසා එද තිබූ ඊශ්වරවාදය බිඳ හෙළී අනීශ්වර වාදයත් ආත්මවාදය බිඳහෙළී අනාත්ම වාදයත් යාච්ඥා හා භක්තිමාර්ගය අවුරා ඥනමාර්ගයත් ලෝකයට පැහැදිළි විය. ඒ නිසා ක්‍රි: පූ: 6 සියවසේ අග කොටසේ දී ඉන්දීය දර්ශනාවලියේ අග්‍රඵලය වශයෙන් බෞද්ධ දර්ශනය ප්‍රථම අංකය දිනාගත් බව කිව හැකි ය.

ඥානමාර්ගයට ම ගෞරවවන ධර්ම යක් පහළ කළ බුදුරජාණන් වහන්සේ ඊට අවශ්‍ය සිතීමේ හා විමසීමේ නිදහස ද පෙන්වා එහි සාර්ථකත්වය ද පැහැදිළි කළසේක. කාලාම සූත්‍රයෙන් ප්‍රධාන වශයෙන් උගන්වනුයේ පුද්ගලයාගේ ඒ නිදහස පිළිබඳව යි. ස්වෛරිව සිතන් ටත්, මත පළකරන්ටත් ඉඩ කඩ සැලැසිණි. සාකච්ඡාකිරීමෙන් අදහස් ඉදිරිපත් කිරී මටත් ප්‍රතික්ෂෙප කිරීමටත් නිදහස හිමි කර දුන් අයුරු විනය පිටකයෙන් ම පැහැදිළිව ම පෙනේ. අන් ඉගැන්වීම් තබා තමා ප්‍රකාශ කරන දේ වුවද, කිසිම බාහිර පෙළඹවීමකින් නො පිළි ගතයුතු බවත් විමසීමෙන් ම පිළිගතයුතු බවත්, උන්වහන්සේ ප්‍රකාශ කළසේක. එසේම උන්වහන්සේගේ ධර්මයට ද වහල් නො විය යුතු බව ද ඉගැන්වූ සේක.

මහණෙනි, මම ධර්මය පසුරක් හැටියට ලොවට හඳුන්වමි. එය එතරවීම පිණිසමුත් කර තබාගෙන යාම පිණිස නොවේ'' යැයි අලගද්දූපම සූත්‍රයේ දී මතක්කර දී ඇත. බෞද්ධදර්ශනයට ම ආවේණික වූ මේ උසස් ලක්ෂණයන් නිසා එහි ශ්‍රේෂ්ඨත්වය අසීමිත ය. එපමණක් ද නොව බුද්ධධර්මය පරලොව ජීවිතයත් විමුක්තියත් සඳහා ම නොව මෙලොව ජීවිතයට සම්බන්ධ විමුක්තිය සඳහා ම බවත් පොදුසමාජය සඳහා උසස් ආචාර ශික්ෂාධර්ම මාර්ගයක් ද සාර්ථක ජීවන මාර්ගයක් ද සඳහා නොවරදින උපදෙස් ඇතුළත් දේශනයක් බවත් පැහැදිලි වෙයි. මහාමඞ්ගල, සිහාලොවා ද, ව්‍යග්ඝපජ්ජ ආදී සූත්‍රයන් ඒ සඳහා වෙසෙසින් දෙසූසේක. බෞද්ධදර්ශනයේ තවත් ශ්‍රේෂ්ඨ ලක්ෂණයක් නම් එය මිනිසා ගැනම වැඩියෙන් සැලකිලිමත් වූ ධර්මයක් වීම යි. මිනිසාගේ තත්ත්වය ඔහුගේ සාංසාරික මාර්ගය ඔහුගේ විමුක්තිය ආදී කරුණු විමසා ඊට පිළියම් පැහැදිලි කිරීමට වෙහෙසුණා මිස ලෝකෝත්පත්තිය, සත්වයාගේ ආදිමූලය ලෝකය ශාස්වත ද, අශාස්වත ද යනාදී කරුණු ගැන බුදුන් වහන්සේ සැලකිලිමත් නො වූ බව ධර්මයෙන් පෙනේ. එය විරාගයට කරුණු නො වන බැවිනි.

බුද්ධධර්මය සෙසු ආගමික දර්ශනයන්ට හාත්පසින් ම වෙන් වූ දර්ශනයක් යැයි පෙර'පර දෙදිග බොහෝ උගත්තු පිළිගනිති. එහෙත් නූතන ඉන්දියානු දර්ශනිකයෙකු වූ සර්වපල්ලි රාධා ක්‍රිෂ්ණන් මහතා මේ මතය එසේ ම නොපිළිගන්නා බව පෙනේ[5] බුද්ධාගම අළුත් වූද ස්වාධීනවූද ආගමක් නොවේ. එය ඊට වඩා බොහෝ පැරණි හින්දු ආගමින් පැන නැගුණෙකි. සමහර විට එහි ම ප්‍රභේදයක් හෝ ඊට විරුද්ධ හෝ මතයෙකි යනු ඔහුගේ මතය යි. එය එසේම යැයි පිළිගත හැකිද? බුද්ධධර්මය හින්දු ධර්මයේ විකාශනයක් හෝ ප්‍රතිසංස්කරණයක් හෝ නො වන බව පෙනේ. එය හැම කල්හි ම ලොව ඇති සත්‍යමාර්ගයෙකි. හින්දු ආගමයේ සත්‍ය දෙයක් වේ නම් ඒ සත්‍යය එහි එකතුවීම නිසා ඒ ධර්මයන්ගේ විකාශනයෙකැ යි කිව නොහැකි ය. බුදුරඳුන් පහළ වෙන තාක් සර්ව සම්පූර්ණ දර්ශනයක් නො වීය. හරි වැරදි දෙකින් මිශ්‍ර වූ ඒවා ම වූහ. සත්‍යය ලෝකය හමුවේ තබන විට ඊට පෙරැ පැවැති දර්ශනයන්ගේ යම්කිසි ස්වල්ප වූ හෝ සත්‍යයක් තිබුණේ නම් එය තම දර්ශනයට අන්තර්ගතවීම පුදුමයෙක් නො වේ. මේ නිසා රාධා ක්‍රිෂ්ණන්ගේ මතය පිළිගත නොහැකි යි.

බුදුන් වහන්සේ මහාපරිනිබ්බාන සූත්‍රයෙහි සුභද්‍ර භික්ෂුවට තමන් වහන්සේ ගේ ධර්මය කෙබඳු එකක් දැයි දෙසා ඇත. ධම්මාරාම භික්ෂූන් වහන්සේ තමන් වහන්සේ වෙත කැඳ වූ වේලාවේ දී සිදුවී ඇති සාකච්ඡාවෙන් බුදුන් වහන්සේත්, බුඩ ධර්මයත් අතර පවතින තත්ත්වය හෙළිවී ඇත. මේ හැම කරුණක් ම විමසිල්ලෙන් බලන විට බුද්ධාගම ආගමයන් අතරැ ශ්‍රේෂ්ඨ ආගමය හැටියටත් බුද්ධධර්මය ධර්මයන් අතර ශ්‍රේෂ්ඨ ධර්මය හැටියටත් බෞද්ධ දර්ශනය දර්ශන අතරැ ශ්‍රේෂ්ඨ දර්ශනය හැටියටත් අගය කළ හැකි යැයි මට හැඟේ.

---

1. දීඝනිකාය (බු. ජ. මු.)
2. ධම්මපද 160
3. 1965 වෙසක්, (සංස්කෘතික දෙපාර්ත මේන්තුව) 10 පිටුව.
4. සංයුත්තනිකාය (මජ්ඣිමපණ්ණාසක – උපායවග්ග 59 සූත්‍රය)
5. Indian Philosophy,